# සූත්‍ර ධර්ම ආශ්‍රයෙන් ගැටළු විසදාගැනීම

## 12.05. 2018 - ශ්‍රී ලංකාරාමය

## නවසීලන්තය

## ධම්මකථිකසුත්තං

‘‘චත්තාරොමෙ, භික්ඛවෙ, ධම්මකථිකා. කතමෙ චත්තාරො? ඉධ, භික්ඛවෙ, එකච්චො ධම්මකථිකො අප්පඤ්ච භාසති අසහිතඤ්ච; පරිසා චස්ස න කුසලා හොති සහිතාසහිතස්ස. එවරූපො, භික්ඛවෙ, ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති.

‘‘ඉධ පන, භික්ඛවෙ, එකච්චො ධම්මකථිකො අප්පඤ්ච භාසති සහිතඤ්ච; පරිසා චස්ස කුසලා හොති සහිතාසහිතස්ස. එවරූපො, භික්ඛවෙ, ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති.

‘‘ඉධ පන, භික්ඛවෙ, එකච්චො ධම්මකථිකො බහුඤ්ච භාසති අසහිතඤ්ච; පරිසා චස්ස න කුසලා හොති සහිතාසහිතස්ස. එවරූපො, භික්ඛවෙ, ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති.

‘‘ඉධ පන, භික්ඛවෙ, එකච්චො ධම්මකථිකො බහුඤ්ච භාසති සහිතඤ්ච; පරිසා චස්ස කුසලා හොති සහිතාසහිතස්ස. එවරූපො, භික්ඛවෙ, ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති. ඉමෙ ඛො, භික්ඛවෙ, චත්තාරො ධම්මකථිකා’’ති.

**‘‘චත්තාරොමෙ, භික්ඛවෙ, ධම්මකථිකා** = ‘මහණෙනි ධර්මය දේශනා කරන ධර්ම කථිකයෝ සතර දෙනෙක් වෙති’. **කතමෙ චත්තාරො?** = ‘කුමන ආකාරයේ ධර්ම කථිකයෝද?

මේ පින්වතුනුත් ධර්ම කථියන් ගැන දැනගන්න එක හොඳයි. බුදුරජාණන්වහන්සේගේ කාලයේත් ධර්ම කථිකයෝ හිටියා. ආනන්ද ස්වාමීන්වහන්සේ, සැරියුත් ස්වාමීන්වහන්සේ, අනුරුද්ධ ස්වාමීන්වහන්සේ, කච්චායන ස්වාමීන්වහන්සේ, කාශ්‍යප ස්වාමීන්වහන්සේ වගේ ධර්ම කථිකයෝ වැඩ හිටියා. නමුත් බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා ධර්ම කථිකයෝ හතර වර්ගයක් ඉන්නවා කියලා.

**'ඉධ, භික්ඛවෙ, එකච්චො ධම්මකථිකො'** = මහණෙනි මේ බුද්ධ සාසනයෙහි සමහර (**එකච්චො**) ධර්ම කථිකයෝ

**'අප්පඤ්ච භාසති අසහිතඤ්ච'** = ටිකයි දේශනා කරන්නේ, නමුත් ඒකෙ අර්ථය කියන්නේ නෑ.

මෙතැන කියන්නේ ධර්ම අර්ථය මතු කරන්නේ නෑ කියන එකයි. මේ පළවෙනි ධර්ම කථිකයා ටිකයි දේශනා කරන්නේ නමුත් ඒකෙ අර්ථයක් නෑ.

**'පරිසා චස්ස න කුසලා හොති සහිතාසහිතස්ස'** = බණ අසන පිරිසත් දක්ෂ නෑ (**න කුසලා හොති**) අර්ථය සහ ධර්මය ගලපා ගන්න.

දැන් මෙතනදී බණ කීමකුත් උනා. බණ ඇසීමකුත් උනා. නමුත් අර්ථය ගලපාගන්න දක්ෂ නැති පිරිසක් අතර අර්ථය ටිකක් පමණක් කියන කියන දේශකයෝ ඉන්නවා.

**'එවරූපො, භික්ඛවෙ, ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති'** = 'මේවගේ ධර්ම කථිකයෝ, මෙවැනි පිරිස් වලට ධර්මය දේශනා කරන ධර්ම කථිකයෝ කියන සංඛ්‍යාවට අයත්වෙනවා'.

මේක හොඳට තේරුම් ගන්න. තථාගතයන් වහන්සේ දේශනා කරපු දේශනාවක්. මේ අයත් ධර්ම කථිකයෝ තමයි. ඒ අය බණ කියලත් තිබෙනවා, පිරිස බණ අහලත් තිබෙනවා.

**<u>පළවෙනි ධම්ම කථිකයා</u>**

**අප්පඤ්ච භාසති** = ටිකක් දෙසනවා

**අසහිතඤ්ච** = අර්ථ ගැලපීමක් නෑ

**<u>පරිසා = (පිරිස)</u>**

**න කුසලා හොති** = අදක්ෂයි

**සහිතාසහිතස්ස** = අර්ථයයි අනර්ථයයි ගලපන්න නොහැකියි

අර්ථ ගැලපීමක් නැති, ධර්මය ටිකක් දේසනාකරන මේ ධර්ම කථිකයා අර්ථය සහ අනර්ථය ගලපා ගත නොහැකි පිරිසකට සැබැවටම ධර්ම කථිකයෙක් වෙනවා. ධර්ම කථිකයෙක් නොවෙයි කියලා කියන්න හොඳ නෑ. ඇයි ඒ ? එයාට පිරිසක් ඉන්නවා.

ඊළගට තිබෙනවා

**''ඉධ පන, භික්ඛවෙ, එකච්චො ධම්මකථිකො අප්පඤ්ච භාසති සහිතඤ්ච; පරිසා චස්ස කුසලා හොති සහිතාසහිතස්ස'** = තවත් ධර්ම කථිකයෙක් ඉන්නවා ඒ දේශකයා ටිකක් ධර්මය දේශනා කරනවා, ඒ දේශනාව අර්ථයෙන් යුක්තයි. පිරිස දක්ෂයි අනර්ථය අර්ථය තේරුම් ගැනීමට.

**<u>දෙවෙනි ධම්ම කථිකයා</u>**

ටිකක් දේශනා කරනවා

අර්ථයෙන් යුක්තයි

**<u>පිරිස</u>**

අර්ථය අනර්ථය දන ගැනීමට දක්ෂයි.

**'එවරූපො, භික්ඛවෙ, ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති**' = 'මෙසේ ටිකක් දේශනා කරත් මේ ධර්ම කථිකයා මෙවැනි පිරිසක් ලඟ (අර්ථය අනර්ථය දන ගැනීමට දක්ෂ) ඔහු ධර්ම කථිකයෙක් බවට පත්වෙනවා'.

ඊළඟට තිබෙනවා

**''ඉධ පන, භික්ඛවෙ, එකච්චො ධම්මකථිකො බහුඤ්ච භාසති අසහිතඤ්ච** = 'මහණෙනි මේ සාසනයේ තවත් ධර්ම කථිකයෙක් ඉන්නවා. ඔහු ධර්මය ගොඩාක් කියනවා. නමුත් එය අර්ථයෙන් යුක්ත නෑ.

**'පරිසා චස්ස න කුසලා හොති සහිතාසහිතස්ස. එවරූපො, භික්ඛවෙ, ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති'**. = 'මොහුගෙන් බණ අහන පිරිසටත් එහි අර්ථය අනර්ථය ගැලපීමට නොහැකියි. මොහු මෙවන් පිරිසකට ධර්ම කථිකයෙක් වෙයි'.

ඊළඟට තිබෙනවා

**''ඉධ පන, භික්ඛවෙ, එකච්චො ධම්මකථිකො බහුඤ්ච භාසති සහිතඤ්ච ; පරිසා චස්ස කුසලා හොති සහිතාසහිතස්ස** = 'මහණෙනි මේ සාසනයේ තවත් ධර්ම කථිකයෙක් සිටිනවා. ඔහු ධර්මය බොහෝකොට දේශනා කරනවා. එය අර්ථයෙන්ද යුක්තයි. ඔහුගෙන් ඒ බණ අසන පිරිසද අර්ථය අනර්ථය ගලපා ගන්න දක්ෂයි'.

**'එවරූපො, භික්ඛවෙ, ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති**. = 'ඔහුත් මහණෙනි සැබෑවටම මෙවැනි පිරිසකට ධර්ම කථිකයෙක් වෙයි'.

දැන් බලන්න, මේ ගොඩක් බණ කියන, අර්ථයෙන් යුක්ත වෙච්ච බණ කියන ස්වාමීන්වහන්සේ නමක් හෝ ගිහි දේශකයෙක් හෝ ගිහිල්ලා අර්ථය තේරුම් ගන්න බැරි පිරිසකට බණ කියනවා නම් එතකොට ඔහු ධර්ම දේශකයෙක්ද? නෑ. ඒ පිරිසකට ඔහු දේශකයෙක් නොවෙයි. ඇයි ඒ? ගැළපෙන්නේ නෑ. බුදුරජාණන්වහන්සේගේ මේ දේශනා හරි පිරිසිඳුයි.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස අර ඉස්සෙල්ලාම කියපු එකේ ධර්මය තේරෙන්නේ නෑ කියන්නේ?

<u>පිළිතුර</u> - දැන් අපි හිතමු සීල සමාධි ප්‍රඥා කියලා. එක දේශකයෙක් ප්‍රඥා සමාධි සීල කියපු ගමන් තේරුම් ගන්න බෑ. ඒ දේශකයා ඒක කිව්වට එයාට අර්ථය ගලපගන්න බෑ. ඒක අහන අයටත් මේක ගලපගන්නත් බෑ.

ඒ උනාට ස්වාමීන්වහන්ස එතන කියනවනේ ධර්ම දේශකයෙක් කියලා...

මේ ධර්ම දේශකයා ඒ අහන පිරිසට පමණයි ධර්ම කථිකයෙක් වෙන්නේ. තථාගතයන් වහන්සේගේ ධර්ම නිවැරදිව ගෙනියන අර්ථයෙන් නොවෙයි. එතැනදී තථාගතයන් වහන්සේ දේශනා කරන්නේ ඔහු තථාගතයන් වහන්සේගේ දේශනාවට දේශකයෙක් නොවුනට ඒ පිරිසට දේශකයෙක් බවයි.

ඒ කියන්නේ ස්වාමීන්වහන්සේ නිකන් වචන ටිකක් කියනවා විතරයිද?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව් එහෙම එකක් තිබෙනවා. මම නවසීලන්තයේ ඉඳල ලංකාවට ගිහිල්ලා එක සේනාසනයකට ගියා. මට ආරාධනාවකුත් තිබුණා එන්න කියලා. මම ඉතින් හැන්දෑවේ ගියා. යනකොට ඒ ගමේ මිනුස්සුන්ට එන්න කියලා මල් වට්ටි හදලා සාධු කාර දීලා මහා පිරිසක් එකතුවෙලා පෙරහැරකින් ධර්ම ශාලාවට මාව වඩම්මවාගෙන ගියා. ඉතින් ඒ ස්වාමීන්වහන්සේ මයික් එක්කුත් දාල මාව පිළිගන්න කථාවක් කළා. 'නවසීලන්තේ අසවල් නුවර ඉන්න ජිනාලංකාර කියන ස්වාමීන්වහන්සේ වැඩම කරා. පිංවතුන් සතුටුවෙන්න ඕන, මේ ස්වාමීන්වහන්සේ එකේ ඉදන් විසාල සාසනික සේවාවක් කරනවා. තථාගතයන් වහන්සේ ධර්මය මේ විදියට දේශනා කරනවා. උන්වහන්සේ දුක්ඛ සමුදය නිරෝධය මාර්ගය කියලා දෙනවා. දුක්ඛ

සත්‍යය කියන්නේ මේකයි. ඒ නිසා අපි සන්තෝස වෙන්න ඕන ජාති දුක, ජරා දුක, මරණ දුක, සෝක දුක, ව්‍යාධි දුක, ඒ හාමුදුරුවෝ ඒවත් කියනවා. තථාගතයන්වහන්සේ කොච්චර මහන්සි වෙලාද පාරමී පුරලා තියෙන්නේ. දාන සීල නෙක්ඛම්ම ප්‍රඥා ඛන්ති සත්‍ය අධිෂ්ඨාන ආදිය පූර්ණය කළා, අහවල් ජාතකයේ මේ විදියට උන්වහන්සේ පාරමී පිරුවා. ඒක නිසා ජිනාලංකාර හාමුදුරුවෝ ...' කියලා කිසිම ගැළපීමක් නැතුව කියනවා. නවසීලතයයි දුඛ්‍ය සත්‍යයයි පාරමී භූමියයි කිසිම ගැළපීමක් නෑ. මතක් වෙන වෙන එක කියනවා. ආන්න ඒ වගේ කිසිම ගැළපීමක් නෑ. මිනුස්සුත් සාධුකාර දිදී අහගෙන ඉන්නවා. ඔය මම අත්දැකපු එකක්.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස දැන් නම් අපිට හොඳටම පැහැදිලියි. අපි සමහර ප්‍රසිද්ධ ස්වාමීන්වහන්සේලාගේ ධර්ම දේශනා අහනවා. ගොඩක් කට්ටියටත් රැස්වෙලා අහනවා පේනවා. ඒ බණ හොඳයි කියලත් කියනවා. ඉතින් අපි කලපනා කරා ඇයි මෙහෙමත් බණ අහන්නේ කියලා. නමුත් ඒ පිරිසට ඒ ස්වාමීන්වහන්සේ ධර්ම කථිකයෙක්. දැන් නම් අපිට ඒක පැහැදිලියි.


<u>ස්වාමීන්වහන්සේ</u> - තථාගතයන්වහන්සේගේ දේශනාවේ ඉන්න එක හරි හොඳයි මහත්මයා. හිත ගට්ටනය කර ගන්නේ නැතුව තථාගතයන් වහන්සේගේ දේශනාවේ හිටියහම හරිම හොඳයි. ඒක බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙනවා. උදායි හාමුදුරුවන්ට විශාල පිරිසක් හිටියා කියලා කියනවා. ඒ වෙලාවේ ආනන්ද හාමුදුරුවෝ ගිහිල්ලා කියනවා බුදුරජාණන්වහන්සේට මෙහෙම උදායි හාමුදුරුවෝ බණ කියනකොට විසාල පිරිසක් ඇවිල්ලා කියලා. ඒ වෙලාවේදී බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා 'මහණෙනි ඔය බණ කියන වැඩේ හැම එක්කෙනාටම කරන්න බෑ' කියලා. ඊට පස්සේ බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා ධර්මය ගළපලා දේශනා කරන්න ඕන, පිළිවෙලක් තිබෙන්න ඕන, අර්ථය විස්තර කරන්න ඕන ආදී වශයෙන්. මේ කථාව තිබෙන්නේ පඤ්චක නිපාතයේ.

බුදුරජාණන්වහන්සේගේ දේශනා හොඳට අහන්න කියවන්න. මේ ධර්මය කියවලා අහලා තේරුම් අරගෙන බුදුරජාණන්වහන්සේ කෙරෙහි ධර්මය

කෙරෙහි ගෞරවයෙන් බුදුගුණ වඩාගෙන යනකොට කිසිතැනක වරදින්නේ නැහැ. ඉතින් ඔහොම ගිහිල්ලා කවදාහරි දවසක පාරමී ගුණ පිරිච්ච අය ධර්මයට එකතු වෙනවා. එහෙම තමයි තිබෙන්නේ.

හොඳයි එහෙනම් සැමදෙනාටම පිරිසිඳු ධර්මය අවබෝධ වේවා! අර්ථය ධර්මය නිරුක්ති ප්‍රතිභානය කියන්නාවූ ධර්ම තේරුම් අරගෙන ඒවා ඉතාමත්ම හොඳින් අවබෝධ කරගෙන වටහාගෙන, ඒවාගේම සැම දෙනාම මේ දුක්ඛ ආර්ය සත්‍යය සමුදය නිරෝධ මාර්ග කියන චතුරාර්‍ය සත්‍යය ධර්මයන් පැහැදිලිව පිරිසිඳුව ඉතාමත්ම හොඳින් නිවැරදිව අවබෝධ කරගෙන සංසාර දුකෙන් මිදිලා අමාමහ නිවනෙන් සැනසෙන්න ලැබේවා! නිවන් අවබෝධය පිණිස මේ ධර්මය සැමදෙනාටම පිහිට වේවා! හේතු උපනිශ්‍රය වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි